# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

2018 මැයි මස 25 වන දින

**II** වන කොටස

අතිරේකය

(2018.05.25 දින නිකුත් කරන ලදී)


# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන)

**දකුණු ආසියාතික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනයෙහි ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මඟින් පිහිටුවන ලද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 10.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල
ආරක්ෂක විශ්වවිද්‍යාලය
(විශේෂ විධිවිධාන)

එල්. ඩී. — ඕ. 27/2018

**දකුණු ආසියාතික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනයෙහි ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මඟින් පිහිටුවන ලද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2018 අංක දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

දකුණු ආසියාතික තාක්ෂණික හා වෛද්‍ය ආයතනයේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය වෙත අන්තර්ග්‍රහණය කිරීම.

**2.** (මෙහි මින්මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත -

(අ) දෙදහස් නවයේ සැප්තැම්බර් මස පහළොස්වන දිනයෙන් ආරම්භ වී, දෙදහස් දාහතේ මැයි මස පහළොස්වන දිනයෙන් අවසන්වන කාලසීමාව අතරතුර (මෙහි මින්මතු "සයිටම්" යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු ආසියාතික තාක්ෂණික හා වෛද්‍ය ආයතනයේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් අතරින් මූලික සුදුසුකම් ලබා ඇති ශිෂ්‍යයන්, එම්බීබීඑස් උපාධිය (කේඩීයූ) ප්‍රදානය කිරීම සඳහා වන අධ්‍යයන වැඩසටහන හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලය වෙත අන්තර්ග්‍රහණය කිරීම;

(ආ) එම්බීබීඑස් උපාධිය (කේඩීයූ) ප්‍රදානය කිරීම සඳහා වන අධ්‍යයන වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කරනු ලබන්නා වූ, (අ) ඡේදය යටතේ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කරන ලද ශිෂ්‍යයන්ට එම්බීබීඑස් උපාධිය (කේඩීයූ) ප්‍රදානය කිරීම;

2—PL 010803 —525 (2018/05)

(ඇ) මූලික සුදුසුකම් සහිත හා නියමිත දින හෝ ඊට පෙර සයිටම් හි එම්බීබීඑස් උපාධිය ප්‍රදානය කිරීම සඳහා වන අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයන්ට ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කළමණාකාරිත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන් මත එම්බීබීඑස් උපාධිය (කේඩීයූ) ප්‍රදානය කිරීම; සහ

(ඈ) (අ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් ශිෂ්‍යයන්ට එම්බීබීඑස් උපාධිය (කේඩීයූ) ප්‍රදානය කරනු ලැබිය යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසි තීරණය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කළමණාකාරිත්ව මණ්ඩලය විසින් යොදා ගත යුතු උපමාන තීරණය කිරීම,

සඳහා බලතල තිබිය යුත්තේ ය.

අර්ථ නිරූපනය.

**3.** මේ පනතේ-

"මූලික සුදුසුකම්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් 'S' (සාමාන්‍ය) සාමාර්ථ ලබා තිබීම හෝ රසායන විද්‍යාව, ගණිතය සහ ජීව විද්‍යාව යන විෂයයන් සඳහා සමාන සුදුසුකම්ලත් සිසුන්ගේ සමාන සුදුසුකම් ද ඇතුළත් සමාන විදේශීය සුදුසුකමක් ලබා තිබීම අදහස් වේ;

"එම්.බී.බී.එස්." යන්නෙන්, වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.